**බලංගොඩ ප්‍රාදේශීය සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන

--------------------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය 2015 මාර්තු 17 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 පෙබරවාරි 08 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජුනි 29 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

--------

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට බලංගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ දිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රජය අංශයේ ගිණුම්කරන ප්‍රමිත වලට අණුකූලව සත්‍ය සාධාරන තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුලදී ප්‍රාදේශීය සභාවේ ආදායම් සහ වියදම් ගිණුම් සඳහා පොදු ලෙජරයේ ගිණුම් පවත්වා නොතිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ස්ථාවර වත්කම් යටතේ ඉඩම් ගොඩනැගිලි ලෙස දක්වා ඇති රු.8,700,000 වටිනාකමට ස්ථාවර වත්කම් ලේඛණයෙහි ඇතුලත් සභාව සතු දේපළ 16 ක වටිනාකම තක්සේරු කර ගිණුම් වල අනාවරණය කර නොතිබුණි.

1.3.2 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

---------------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) අත්තිකාරම් ලේඛණය අනුව 2014 දෙසැම්බර් 31 දිනට නොපියවූ අත්තිකාරම් ගිණුමේ වටිනාකම රු.626,491ක් විය.

(ආ) දීර්ඝ කාලයක් සිට ඉදිරියට පැවත එන රු.11,390 ක් වූ ලැබිය යුතු බදු කුලී අයකර ගැනිමට අපොහොසත් වී තිබුණි.

(ඇ) යකහලු මුකලාන ප්‍රදේශයේ බිම් කට්ටි කුලී ලෙස බිම් කට්ටි 19 ක් ,වෙනුවෙන් අයවිය යුතු රු 34,250 ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ඈ) දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කලයුතු එකතුව රු 156,938 ක් වූ බදු 2014 වර්ෂය අවසන් වන විටත් ප්‍රේෂණය නොකර විවිධ තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි

1.3.3 නීතිරිති රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

-------------------------------------------------------

පහත සඳහන් නීති රීති, රෙගුලාසි වලට විධිවිධාන හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීතිරිති රෙගුලාසි ,විධිවිධාන කළමනාකරණ තීරණ වල යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| | --------------------------------- | ---------------------- |
| (අ) | භාණ්ඩාගාර ලේකම්ගේ 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI /2002/02 දරණ චක්‍රලේඛය | සභාව සතුව පවතින රු.552,174 ක්වූ පරිගණක හා උපාංග සම්බන්ධ වත්කම් ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. |
| (ආ) | 2009 සැප්තැම්බර් 18 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක PF – 437 | යොමුගත චක්‍රලේඛ අවශ්‍යතාවයට පටහැනිව සභාවට අයත් කැබ් රථයක් රු.6,390,000 කට නියෝජිතයෙකු හරහා රක්ෂණය කිරීම උදෙසා සමාලෝචිත වර්ෂය තුල දී රු74,988 ක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට ගෙවා තිබුණි. |

02. මූල්‍ය සමාලෝචනය

----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,657,594 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්ථන වියදම රු.1,943,628 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 4,601,222 ක වර්ධනයක් ඇති වී තිබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

------------------------------------

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සමස්ථ පුනරාවර්තන ආදායම රු. 9,965,394 ක වැඩිවීමත්,ගමන් වියදම් සහ සැපයුම් හා උපකරණ ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තු වෙනුවෙන් කල වියදම ඉකුත් වර්ෂයට වඩා රු. 838,721කින් අඩු වී තිබීමත් ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට හේතු වි තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

----------------------

2.3.1. ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

-------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ විග්‍රහයක් පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ජනවාරි 01 දිනට හිඟය | වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම | 2014 සහ ඊට පෙර වර්ෂ සඳහා තත්‍ය ලැබීම් | දෙසැම්බර් 31 දිනට හිඟය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| බලපත්‍ර ගාස්තු | 111,450 | 35,000 | 36,750 | 109,700 |
| වරිපනම් බදු | 248,566 | 509,702 | 514,880 | 243,388 |
| අක්කර බදු | 38,834 | 27,638 | 19,919 | 31,115 |
| මුද්දර ගාස්තු | 3,360,721 | 6,000,000 | 5,982,835 | 3,343,556 |

දෙසැම්බර් 31 වන දිනට කඩ කුලී රු.24,567 ක් හිඟව පැවතුණි.

2.3.2 උසාවි දඩ

-----------

ඉකුත් වර්ෂයේ අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා අයවිය යුතු උසාවි දඩ මුදල් රු.20,000 ක් අයවී නොතිබුණි.

2.3.3 මුද්දර ගාස්තු

----------------

(අ) 2012 ජුනි,ජුලි,අගෝස්තු මාස වලට අදාල රු.991,400 ක් වූ මුද්දර ගාස්තු 2014 දෙසැම්බර් 31 දින වන තෙක් අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

(ආ) සභාවට ලැබිය යුතු මුද්දර ගාස්තු සහ ලද මුද්දර ගාස්තු අතර රු.942,399 ක ඌනතාවයක් නිරීක්ෂණය විය.

2.3.4 වරිපනම් බදු

--------------

2014 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට නොහැකි වූ හිඟ වරිපනම් බදු ශේෂය රු 243,389 කි.

03 මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

3.1 JCB යන්ත්‍රය

2014 වර්ෂයේ දී JCB යන්ත්‍රය සේවයේ යොදවා රු 2,458,680 ක ආදායමක් උපයා තිබුණු නමුත් එම යන්ත්‍ර නඩත්තු කිරීම සඳහා 2014 වර්ෂයේ දී රු .2,119,937 ක වියදමක් සභාව විසින් දැරීම හේතුවෙන් අදාල යන්ත්‍රයෙන් සභාව උපයා ඇති ශුද්ධ ආදායම රු 338,743 ක් පමණි.ඒ අනුව මෙම යන්ත්‍රය සඳහා ඉපයූ ආදායමෙන් සියයට 86 ක් නඩත්තු වියදම ලෙස දරා තිබුණි.

2014 දෙසැම්බර් 31 දිනට JCB යන්ත්‍රය කුලියට දීමෙන් අයවිය යුතු රු 382,079ක මුදලක් හිඟව පැවතුණි.

3.2 නිෂ්ක්‍රිය සහ ඌනඋපයෝජිත වත්කම්

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) 2010 අගෝස්තු 23 දින කල්තොට ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් ලැබී ඇති ට්‍රැක්ටර් හා උපකරණ කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොතිබුණි.

(ii) සභාව සතු එක් කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රයක් ගලවා ගාල්කර තිබුණි.

(iii) සභාව සතු ගලි බවුසරය නිශ්කාර්යව පැවතුණි

(iv) 2014 අගෝස්තු 01 දින මිලදී ගන්නා ලද ප්ලාස්ටික් කසල බඳුන් 134 ක් ප්‍රයෝජනයට නොගෙන ගබඩාවේ රඳවා තිබුණි.

(v) අංක SG/JU/ 7981 දරණ යතුරු පැදිය සහ අංක 270/0264 දරණ ට්‍රැක්ටර් රථය ගලවා පසෙක ලා තිබුණි.

3.3 හඳුනාගත් අලාභ

2015 මාර්තු මාසයේදි ගබඩාවේ කරන ලද භෞතික පරික්ෂාවේදි පහත සඳහන් තොග ඌනතාවයන් අනාවරණය විය.

| භාණ්ඩ විස්තරය | ඌනතාවය | වටිනාකම |
|---|---|---|
| | ගණන | රු. |
| ගේජ් 28 ටකරන් | 10 | 17,875 |
| ලමා පුටු | 25 | 9,625 |
| හියුම් පයිප්ප | 13 | 92,815 |

3.4 ව්‍යාපෘති ප්‍රමාද කිරිම
----------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) පළාත් මඟ නැගුම වැඩසටහන යටතේ රු.19,673,740 ක ප්‍රතිපාදන සලසා ඇති කර්මාන්ත 24 ක් ඉටු කිරිම සඳහා රු.19,205,249 කට ප්‍රාදේශීය සභාව ගිවිසුම් වලට එළඹ තිබු අතර 2014 දෙසැම්බර් 31 දිනට පෙර සියළුම කර්මාන්ත අවසන් කිරිමට නියමිතව තිබුණි. එම කර්මාන්තයන්හි ඉටුකර ඇති වැඩ වටිනාකම රු.5,558,322 ක් වන අතර ,ඒ සඳහා කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා ඇති මුදල රු.3,981,015 කි. මෙම කර්මාන්ත, ඉදිකිරිම් නවතා දමා තිබුණි.

(ii) දොරින් දොරට ගමින් ගමට වැඩ සටහන යටතේ රු.2,600,000 ප්‍රතිපාදන සැලසී ඇති අතර කර්මාන්ත 08 ක් ඉටුකිරිම සඳහා රු . 2,561,576 කට සමිති 08 සමඟ ගිවිසුම් වලට එළඹ තිබුණි. 2014 දෙසැම්බර් 31 දිනට අවසන් කල යුතුව තිබු මෙම කර්මාන්තයන්හි ඉටු කල වැඩ වටිනාකම රු.918,537 ක් වන අතර, සාධාරණ හේතුවකින් තොරව කර්මාන්ත ඉටුකිරිම අතරමග නවතා දමා තිබු බව 2015 මාර්තු 01 දින කරන ලද භෞතික පරික්ෂාවේදි දක්නට ලැබුණි.

04 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය
--------------------------------------

4.1 අයවැය පාලනය
-------------------

සභා සම්මතයකින් තොරව අවස්ථා 7 කදී රු.3,566,000 ක් ප්‍රතිපාදන මාරු කර තිබුණි.

05 පද්ධති හා පාලන
----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානයයොමු කරනු ලැබේ.

(අ) අයවැය පාලනය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය